**යාපනය කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - ඉරණමඩු කොටස - 2018**

-----------------------------------------------------------------------------------------------------------

යාපනය කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ඉරණමඩු කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2711 දරන ණය ගිවිසුම්වල II B ව්‍යවස්ථාවේ 2 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම ප්‍රකාරව, අභ්‍යන්තර කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන ආතනය විසින් මෙම මෙම ව්‍යාපෘතිය නියාමනය කරන අතර, උතුරු පළාත් සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඉරණමඩු ජලාශයේ ජලය රඳවාගැනීමේ ධාරිතාවය සහ ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩොලර් 16.91 ක් හෙවත් රු. මිලියන 2,198.30කට සමාන වන අතර, ඉන් ඇ.ඩොලර් 13.49ක් හෙවත් රු. මිලියන 1, 753.70ක් මූල්‍ය ප්‍රතිපාදන ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබාදීමට එකඟ වී ඇත. ඉතිරි ප්‍රතිපාදනයන් ශ්‍රී ලංකා රජය මඟින් ලබාදීමට බලාපොරොත්තු වේ. 2011 මාර්තු මස 06 වන දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද අතර, 2017 අගෝස්තු 14 දින වන විට අවසන් කිරීම සඳහා සැලසුම් සකස් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කාලය 2020 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 මතය

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික කාර්යසාධනය

වැඩ සැලසුම් අනුව, 2018 ජුනි 30 වන විට ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතේ වූ පැකේජ 06ක් සහ සියලු පැකේජ යටතේ වූ වැඩ අවසන් කර තිබුණි. කෙසේවෙතත්, වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ අවිධිමත් ආකාරයේ ප්‍රතිසංවිධාන කටයුතු සහ දුර්වල ගංවතුර කළමනාකරණ ක්‍රමවේද හේතුවෙන් 2018 වර්ෂයේ දෙසැම්බර් 22 දින ඇතිවූ ගංවතුර තත්ත්වය නිසා ගොවිබිම් සහ පහත් භූමි ප්‍රදේශවල පදිංචිකරුවන්ට සිදුවූ හානියෙන් ඔවුන් ආරක්ෂා කරගැනීම සඳහා රු. මිලියන 57.49ක පිරිවැයක් දරා ඉදිකරන ලද ගංවතුර

බැම්ම දැඩි ලෙස හානියට ලක්ව තිබුණි. පැහැදිලි කිරීම්වලට අනුව, අදාළ දිනයේ කෙටි කාලය තුළ මිලි මීටර 380කට වඩා වැඩි වර්ෂාපතනයක් ලැබී ඇති අතර, ඉදිකරන ලද නව ගංවතුර බැම්ම වසර 500කට වරක් ඇතිවන මෙවැනි ගංවතුරක් දරාගැනීම සඳහා ආර්ථිකමය වශයෙන් සුදුසු නොවේ.

## 3.2 වැඩබිම් අධ්‍යයනයේ නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලදී.

| | විගණනයේදී හඳුනාගත් අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ජලය බැසයන ප්‍රදේශයේ වූ තණ පිඩලි සඳහා රු. මිලියන 13.27ක මුළු වියදමක් දරා ඇතත්, දුර්වල කළමනාකරණය හේතුවෙන් එය වියළී ගොස් ඇති අතර, බැම්ම ඛාදනයට ලක්වී ඇත. | නිෂ්ඵල වියදම් වේ. | කොන්ත්‍රාත්කරු විසින් අවදානම් සහිත කාලසීමාව තුළ තණ පිඩලිවලට ජලය යොදා නොතිබුණි. වියළි කලාපයට සුදුසු තණ පිඩලි තෝරාගෙන වගාකිරීමෙන් එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | තිරස්ථායී අයුරින් ජලාශ බැම්ම පවත්වාගෙන යාම පිළිබඳ අවධානය යොමුකර, තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | රු. මිලියන 17.65ක පිරිවැයක් දරා ඉදිකරන ලද පටු ජලමාර්ගවලින් ජලය ඒකරාශී වන ස්ථානය (Toe drain) , කුඩා ජලමාර්ග (berm drains) සහ පියගැටපෙළක් ලෙස ජලය ගලා එන ස්ථාන (step drains) වල් පැළෑටි සහ කුණු කසල තැම්පත්වීම නිසා අවහිර වී තිබුණි. මෙම දුර්වල නඩත්තුකිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ගලා එන ජලය මිනුම් කිරීම සඳහා රු. මිලියන 3.59ක පිරිවැයක් දරා ඉදිකරන ලද V හැඩැති ස්ථාන නිවැරදි ලෙස උපයෝජනය කර නොතිබුණි. | -එම- | සමහර ස්ථානවල එකතැන ජලය රැඳී තිබුණද, එය පටු ජල මාර්ගයන්ගෙන් ජලය ඒකරාශී වන ස්ථානයට ගලායන අනවරත ජල ප්‍රවාහයේ V කැපුම් තුළින් ජලය කාන්දුවීමට බලපෑම් නොකරයි. තවද, නඩත්තු කටයුතු සඳහා සේවකයන් බඳවාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නියමිත ප්‍රමිතියෙන් ජලාපවාහන මාර්ග පවත්වාගැනීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ඇ) | රු. මිලියන 10.01ක පිරිවැයක් දරා අලුතින් ප්‍රතිස්ථාපනය කරන ලද ඔගී හැඩැති දොරටු රහිත පිටවානේ ජල කාන්දුවීම් දැකිය හැකි විය. | අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගත නොහැක. | මෙම දුර්වලතා නිවැරදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට මේ සම්බන්ධයෙන් දැනුම් දී ඇත. ජලාශයේ මට්ටමටම ජල මට්ටමද පවතින බැවින් නිවැරදි | -එම- |

| | | | |
|---|---|---|---|
| | | කිරීම සඳහා යම් කාලයක් ගතවන නිසා, ජල මට්ටම පහළ ගිය වහාම මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවට ඔවුන් එකඟ විය. | |

**3.3 ඌන උපයෝජිත සම්පත්**

| **විගණනයේදී හඳුනාගත් අඩුපාඩුව** | **බලපෑම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|
| විදුලිය ජනනය කිරීම සඳහා සූර්ය පැනලයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් රු. මිලියන 21.96ක පිරිවැයක් දරා ඉහළ කොටසේ ඉදිකරන ලද කොන්ක්‍රීට් අත්තිවාරමක් සහිත ගොඩනැගිලි 05ක් භාවිතයට ගෙන නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමේදී අනවශ්‍ය පරිදි ධාරිතාව ඉක්මවා කටයුතු කර ඇත. | නියමිත ගිවිසුම අනුව, බිම් මට්ටමින් ඉහළට සූර්ය පැනල සවිකිරීම සඳහා ගොඩනැගිල්ලක් සෑදීමට ප්‍රතිපාදන ලබාදී නොමැත. නමුත් පසුව, ව්‍යාපෘතියේ තිරසරභාවය හා ගොවීන්ගේ ප්‍රතිලාභ පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අප විසින් තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා වූ අරමුදල් ඌනතාවය නිසා සම්පූර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමට සහ විදුලිය නිෂ්පාදනය කිරීමට නොහැකි විය. | කළමනාකරණය විසින් බලාපොරොත්තු වන අරමුණ වෙනුවෙන් ඉදිකළ වත්කම් යෙදවීමට අවශ්‍ය සාධනීය පියවර ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණයට සම්බන්ධ අඩුපාඩු

| විගණනයේදී හඳුනාගත් අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| 2018 වර්ෂයේ ජූනි 30 දින වන විට ව්‍යාපෘතියට අදාළ සියලුම වැඩ අවසන් කර සම්පූර්ණ වාර්තාවද ඉදිරිපත් කර තිබූ නමුත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එහි පැවති අතර, 2018 ජූලි සිට නොවැම්බර් දක්වා සේවක වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු. මිලියන 1.56ක මුදලක් වැය කර තිබුණි. | ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සඳහා වූ අතිරේක පිරිවැයකි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, කාර්ය මණ්ඩල පුහුණු කටයුතු, වැඩබිම් අධ්‍යයනය සහ අඩුපාඩු සුපරීක්ෂණ කටයුතු හා අලුත්වැඩියාවන් ආදී කටයුතු පවත්වාගැනීම වෙනුවෙන් තවදුරටත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාකාරී මට්ටමේ පවත්වාගෙන ඇති බව | අදාළ ක්‍රියාකාරකම් සඳහා අවම සේවක සංඛ්‍යාවක් පවත්වාගත යුතු වේ. |